## 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා
## විනිමය කොමිෂන් සභා පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන්සභා පනතේ 55 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 52 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින්සාදන ලද නියෝග

**මහින්ද රාජපක්ෂ**
**ජනාධිපති**

2010 නොවැම්බර් මස 19 දින
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2010 අංක 01 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා (සම්බන්ධිත තැනැත්තන්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ඉහත කී පනතේ කාර්ය සඳහා ඒකක භාරයක භාරකරු හෝ බලපත්‍රලත් කළමනාකරණ සමාගමකට අදාළව ‘‘සම්බන්ධිත තැනැත්තා" යන්නෙන් :-

(අ) භාර සමාගමේ හෝ බලපත්‍රලත් කළමනාකරණ සමාගමේ සාමාන්‍යය කොටස් ප්‍රාග්ධනයෙන් සියයට විස්සක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් අයත්වන නැතහොත් භාර සමාගමේ හෝ බලපත්‍රලත් කළමානකරණ සමාගමේ සම්පූර්ණ ඡන්ද ප්‍රමාණයෙන් සියයට විසසක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කෙළින්ම හෝ අන්‍යාකාරයකට භාවිත කිරීමේ හැකියාව ඇති යම් තැනැත්තකු ;

(ආ) ස්වකීය සාමාන්‍ය ප්‍රාග්ධනයෙන් සියයට විස්සක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් භාර සමාගම සහ බලපත්‍රලත් කළමනාකාර සමාගම විසින් ඒකාබද්ධව කෙළින්ම හෝ අන්‍යාකාරයකින් අයිතිය දරන, නැතහොත් භාර සමාගම සහ බලපත්‍රලත් කළමනාකරණ සමාගම විසින් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් සම්පූර්ණ ඡන්ද ප්‍රමාණයෙන් සියයට විස්සක් හෝ වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනු ලබන සමාගමක් ;

(ඇ) භාරකරුගේ අධ්‍යක්ෂවරයෙකු හෝ නිලධරයකු, නැතහොත් ඒකක භාරයක බලපත්‍රලත් කළමනාකරණ සමාගමක් හෝ (ආ) ඡේදයේ දක්වා ඇති සමාගමක් අදහස් වේ.